**තවලම ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
---------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 දෙසැම්බර් 01 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 නොවැම්බර් 17 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට තවලම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) එකිනෙක සමාන වියයුතු ස්ථාවර වත්කම් ගිණුමේ ශේෂය සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය අතර රු.765,692 ක වෙනසක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආදායම් වියදම් ගිණුමේ රු.1,236,151 ක් වූ ඌණතාවය සමුච්චිත අරමුදලට ගලපා නොතිබීම නිසා එකී ප්‍රමාණයෙන් හිමිකම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) හිඟහිටි කඩ කුලී ගිණුමේ ශේෂය රු.24,525 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අවසානයට ණයහිමි ශේෂය රු.62,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

---------------------------

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.47,261,648 ක් වූ ගිණුම් විෂයයන් 07 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන / උපලේඛන අනුව දැක්වෙන ශේෂයන් අතර රු.11,694,802 ක අසමානතා නිරීක්ෂණය විය.

### 1.3.3 අවිනිශ්චිත ගිණුම්

--------------------

වර්ෂ 04 කටත් අධික කාලයක සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.11,493 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය හඳුනාගෙන අදාළ ගැලපීම් කර, ගිණුම් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

### 1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2005 වර්ෂයේ සිට ඉදිරියට ගෙනෙමින් පවතින රු.518,000 ක් වූ ලැබිය යුතු වෙළඳ සංකීර්ණ ඇප තැන්පත් ශේෂය සහ 2013 වර්ෂයේ සිට පැවත එන රු.8,800 ක් වූ හිඟහිටි වෙළඳ බලපත්‍ර ගාස්තු ශේෂය නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කර්මාන්ත වෙනුවෙන් ලැබිය යුතු එකතුව රු.10,031,216 ක මුදල අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසානයට කර්මාන්ත 21 ක් සඳහා ගෙවීමට ඇති එකතුව රු.12,454,024 ක මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) වසර 06 කට අධික කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනෙමින් පවතින රු.1,918,452 ක් වූ ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ශේෂය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.29,271,598 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 08 ක් සම්බන්ධයෙන් විධිමත්ව හා යාවත්කාලීනව පවත්වන ලද ස්ථාවර වත්කම් ලේඛනය ද, රු.2,666,209 ක් වූ මුද්දර ගාස්තු හා උසාවි දඩ සම්බන්ධයෙන් විධිමත්ව පවත්වන ලද මුද්දර ගාස්තු හා උසාවි දඩ ලේඛනය ද, රු.5,253,480 ක් වූ ණයහිමියන් පිළිබඳ විස්තරාත්මක තොරතුරු, පැහැදිලි කිරීම් හා තහවුරු සාක්ෂි ද ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| **නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| **ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි** | |
| (i) මුදල් රෙගුලාසි 570 හා 571(1)(2) | කල් ඉකුත් වූ එකතුව රු.141,000 ක් වූ තැන්පතු ශේෂ 08 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1645 හා 1646 | සභාව සතු වාහන 08 ක් වෙනුවෙන් දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා අඩු වූ ආදායම රු.1,126,312 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා අඩු වූ ආදායම රු.3,990,442 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,864,130 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 අක්කර බදු**

සමාලෝචිත වර්ෂය ආරම්භයේ රු.49,808 ක් වූ හිඟ අක්කර බදු ශේෂය වර්ෂය අවසානයට රු.55,469 ක් දක්වා වර්ධනය වී තිබුණි. හිඟ බදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.2.2** **ව්‍යාපාර බදු**

------------

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ව්‍යාපාර බදු ශේෂය වූ රු.413,960 ක මුදල අයකර ගැනීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.2.3** **කඩ කුලී**

----------

සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.41,550 ක් වූ හිඟ කඩ කුලී ශේෂය හා වෙළඳ සංකීර්ණ අධි ගාස්තු අයකර ගැනීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.2.4** **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.1,971,585 ක් හා උසාවි දඩ වෙනුවෙන් රු.694,625 ක් ලැබිය යුතුව තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1** ආයතනය සතු අබලන් වාහන ඉවත් කිරීම පිළිබඳ වූ 2015 ජූලි මස 10 දිනැති අංක 2/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු නොකර, සභාව සතු ගල්රෝල (මාර්ග තලනය) 2010 වර්ෂයේ සිට අක්‍රීයව පැවතුණි.

**3.2** **කාර්යසාධනය**

-----------------

සභාව විසින් පවත්වාගෙන යනු ලබන ආයුර්වේද මධ්‍යස්ථානය සඳහා ඖෂධ මිලදී ගැනීමට කිසිදු ප්‍රතිපාදනයක් පසුගිය වර්ෂ 04 තුළදීම ලබා දී නොතිබුණි.

**3.3** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ඕපාත උප කාර්යාලයේ 1998 වර්ෂයේ සිට සේවය කළ මුරකරුහට 2010 ජනවාරි 01 දින සිට උප කාර්යාලයේ එදිනෙදා ආදායම් රැස් කිරීමේ කාර්යය හා පුස්තකාලයේ වගකීම් පවරා තිබුණි.

(ආ) සභාවේ සේවකයින් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නියමිත දිනට නොගෙවීම නිසා රු.8,499 ක අධිභාරයක් ගෙවා තිබුණි.

(ඇ) සභාවේ සේවකයින් 14 දෙනෙකුගෙන් අයවිය යුතු රු.112,388 ක ණය ශේෂය අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) **ඕපාත උප කාර්යාල ගොඩනැගිල්ල පරීක්ෂා කිරීම**

------------------------------------------------------------

(i) තවලම ප්‍රාදේශීය සභාවට අයත් ඕපාත උප කාර්යාලයෙහි 2006 වර්ෂයට පෙර ආයුර්වේද බෙහෙත් ශාලාවක් හා මහජන පුස්තකාලයක් පැවති අතර, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට මෙම උප කාර්යාලය දිරාපත් වෙමින් පැවතුණි.

(ii) මෙම ගොඩනැගිල්ලේ පොලිස් මුරපොල පැවති මාස 82 ක කාලය සඳහා වූ රු.410,000 ක කුලී මුදල් අය කරගෙන නොතිබුණි.

(iii) විදුලි බිල් නොගෙවීම නිසා විදුලිය විසන්ධි කර තිබුණු අතර, නැවත විදුලි සැපයුම ලබාගෙන නොතිබුණි.

(ඉ) සභාව විසින් භාවිතයට යොදාගන්නා වාහන 07 ක අයිතිය පවරා ගෙන නොතිබුණි.

(ඊ) සභාවට අයත් අංක 53 – 5698 දරන ඩබල් කැබ් රථය පිළිබඳ කිසිදු තොරතුරක් සභාව සතුව නොතිබුණි.

## 3.4 ආර්ථික නොවූ ගනුදෙනු

---------------------------

පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/පපාකො/2014/01 දරන චක්‍රලේඛයට පටහැනිව සභාවේ සේවයේ නියුතු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධාරියෙක් හා ආදායම් පරීක්ෂක නිලධාරියෙක් සඳහා ගමන් වියදම් ලෙස රු.25,633 ක් ගෙවා තිබුණි.

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

දකුණු පළාත් සභා සංවර්ධන සැලැස්ම යටතේ 2016 මාර්තු 18 දින රු.100,000 ක් තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාමීය පුස්තකාල සංවර්ධන කටයුතු සඳහා සභාව වෙත ලබා දී තිබුණ ද, සභාව සතු පුස්තකාල දෙකෙහිම කිසිදු සංවර්ධනයක් සිදු කර නොතිබුණි.

## 3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

තවලම ප්‍රාදේශීය සභාවට ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා 2011 වර්ෂයේ දී රු.4,567,116 ක් පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය මඟින් අනුමත කර තිබුණු අතර, එහි පළමු වාරිකය වශයෙන් රු.913,423 ක මුදලක් සභාවට ලබා දී තිබුණි. මේ පිළිබඳව පහත කරුණු අනාවරණය විය.

(i) ගොඩනැගිලි ඉදිකිරීමට පෙර ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් මෙම ස්ථානය පිළිබඳ පරීක්ෂා කරවා ගැනීමකින් හෝ පරිසර සංවර්ධන අධිකාරියේ බලපත්‍ර ලබා ගැනීමකින් තොරව කර්මාන්තය ආරම්භ කර තිබුණි.

(ii) මෙම කර්මාන්තය සඳහා භාවිතා කරන ලද ඉඩමේ හිමිකම් ඔප්පුවක් හෝ නිරවුල් අයිතියක් සභාව සතුව නොමැති වුවද, එහි මුර කුටියක් හා ව්‍යාපෘති කාර්යාලයක් ඉදිකර තිබුණි.

(iii) කර්මාන්තයේ ඇස්තමේන්තුවට ඇතුළත් නොවූ කාර්යයන් සඳහා ඇස්තමේන්තුගත මුදල ඉක්මවා දැරූ වියදම රු.902,945 ක් විය.

(iv) එමෙන්ම එම මධ්‍යස්ථානයේ පිහිටි ඉඩම බෙහෙවින් වල්බිහි වී තිබුණු අතර, ගොඩනැගිලිවල දොරවල් හා විදුලි උපකරණ කිසියම් පුද්ගලයෙකු විසින් ගලවාගෙන ගොස් තිබුණි.

(v) 2017 වර්ෂයේ මැයි මස ඇති වූ ගං වතුර තත්ත්වය හේතුවෙන් මෙම ව්‍යාපෘති කාර්යාලය සහිත ගොඩනැගිල්ල මතට පස් කන්දක් හා ගසක් කඩා වැටීමෙන් එය සම්පූර්ණයෙන්ම විනාශ වී තිබුණි.

(vi) සභාව විසින් ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ගිං ගඟ වම් ඉවුරට යාබදව ඉදිකල ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය කිසිදු කාර්යයකට ප්‍රයෝජනයට ගත නොහැකිව විනාශ වී තිබුණු අතර, මේ සඳහා දරන ලද රු.1,459,808 ක වියදම නිෂ්කාර්යය වියදමක් බවට පත් වී තිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 06 ක එකතුව රු.14,212,485 ක් වූ ඉතිරිවීම් ද, තවත් විෂයයන් 02 ක එකතුව රු.239,200 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණු අතර, ආදායම් විෂයයන් 05 ක එකතුව රු.13,531,347 ක් වූ ළඟාකර නොගත් ඉලක්ක ආදායම් ද පැවැතීම නිසා අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 4.2 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස්ගේ (දකුණු පළාත) 2014 පෙබරවාරි 24 දිනැති අංක : දපපා/යහ/01/නා.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර, එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කලමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## 4.4 නොවිසඳී ඇති විගණන ඡේද

--------------------------------

ඉකුත් වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාවේ 2.2.2 ඡේදයේ (අ) යටතේ දක්වා ඇති ඡේදයෙන් පෙන්වා දෙන ලද අඩුපාඩුව නිවැරදි කිරීමට එකඟ වී තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අවශ්‍ය නිවැරදි කිරීම් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

--------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර විගණන විමසුම් මඟින් සභාවේ අවධානයට යොමු කරන ලදී. පහත විස්තර දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| | පද්ධතිය | | පද්ධතියේ ප්‍රධාන අඩුපාඩු |
|---|---|---|---|
| (අ) | වාහන පාලනය | (i) | සභාව සතු වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | | (ii) | නිෂ්ක්‍රීය වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | | (iii) | වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | | (iv) | දෛනික ධාවන සටහන්පත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. |
| (ආ) | ගිණුම්කරණය සහ ලේඛන නඩත්තු කිරීම | (i) | සභාව විසින් වාහන ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | | (ii) | සභාව විසින් ප්‍රධාන ජර්නලයක් නඩත්තු කර නොතිබුණි. |
| | | (iii) | හානි පාඩු පිළිබඳ තොරතුරු ඇතුළත් කර, හානි පාඩු ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| | | (iv) | යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| | | (v) | පරිගණක සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) | ආදායම් රැස්කිරීම | (i) | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | | (ii) | මුද්දර ගාස්තු ආදායම් යාවත්කාලීනව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | | (iii) | කඩ බදු ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | සේවක මණ්ඩල කළමනාකරණය | (i) | කාර්ය මණ්ඩල පුරප්පාඩු පුරවා ගැනීමට මෙන්ම අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | | (ii) | සභාවේ සේවය කළ නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | අයවැය පාලනය | (i) | වියදම් විෂයයන් දෙකක මුළු ප්‍රතිපාදනය ද, තවත් වියදම් විෂයයන් 08 ක සියයට 09 සිට සියයට 62 අතර පරාසයක ඉතිරිවීම් ද පැවැතුණි. |
| | | (ii) | ආදායම් විෂයයන් 05 ක අහිතකර විචලනයන් දක්නට ලැබුණු අතර, එය සියයට 13 සිට සියයට 79 අතර පරාසයක විය. |